# ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
# தேசிய சம்பளங்கள் மற்றும் ஆளணி ஆணைக்குழு
# NATIONAL SALARIES AND CADRE COMMISSION

කාමර අංක 2-116, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, බෞද්ධාලෝක මාවත, කොළඹ 07
அறை இல. 2-116,பண்டாரநாயக்க ஞாபகார்த்த சர்வதேச மாநாட்டு மண்டபம், பௌத்தாலொக மாவத்தை, கொழும்பு 07
Room No.2-116, B.M.I.C.H, Bauddhaloka Mawatha. Colombo 07

| | | | | | |
|---|---|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephone | 2669134 | ෆැක්ස් / பக்ச் / Fax | 2669134 | විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail | nscc@sltnet.lk |
| මගේ අංකය / எனது இல. / My No. | NPC/8/44/274-2/AL | ඔබේ අංකය / உமது இல / Your No. | DMS/1670/V-III | දිනය / திகதி / Date | 2019.01. 14 |


22 JAN 2019

අධ්‍යක්ෂ ජනරාල්
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

<u>උසස් ඩිප්ලෝමා පාඨමාලාවන්හි බාහිර කථිකාචාර්යවරුන්ට සහ අභ්‍යන්තර විභාග සඳහා ගෙවීම් කිරීම- විශ්වවිද්‍යාල විද්‍යායතන</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක හා 2018.10.11 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල යටතේ පිහිටුවා ඇති විශ්වවිද්‍යාල විද්‍යායතන මඟින් පවත්වනු ලබන NVQ 5 හා NVQ 6 පාඨමාලා සඳහා සේවය ලබා දෙන බාහිර කථිකාචාර්යවරුන් සඳහා ගෙවිය යුතු දීමනා පිළිබඳ මෙම කොමිෂන් සභාවේ නිර්දේශ පහත පරිදි වේ.

| NVQ 5 මට්ටමේ වැඩසටහන් සඳහා | | |
|---|---|---|
| | බාහිර කථිකාචාර්යවරුන් සතුවිය යුතු සුදුසුකම් හා පලපුරුද්ද | බාහිර කථිකාචාර්යවරුන් සඳහා(පැයකට රු.) |
| 01 | විෂය ක්ෂේත්‍රයට අදාල ව NVQ-5 මට්ටමේ සුදුසුකම් සහ අදාල විෂය ඉගැන්වීමේ හෝ අදාල කර්මාන්තයේ අවම වසර 5ක පලපුරුද්ද හෝ NCT සමඟ වසර 10ක ඉගැන්වීමේ හෝ අදාල කර්මාන්තයේ පලපුරුද්ද(පළමු සමාසිකයේ(ප්‍රථම වසර) හා දෙවන සමාසිකයේ(දෙවන වසර) ඉගැන්වීම කටයුතු සඳහා පමණි.) | 600/= |
| 02 | විෂය ක්ෂේත්‍රයට අදාල NVQ-6 මට්ටමට සමාන සුදුසුකම් සමඟ අදාල විෂය ඉගැන්වීමේ/කර්මාන්තයේ අවම වසර 5ක පලපුරුද්ද(උදා-HNDE/NDT/NDES වැනි අදාල ක්ෂේත්‍රයේ රජය පිළිගත් වෙනත් සුදුසුකම්) | 700/= |
| 03 | අදාල ක්ෂේත්‍රයේ උපාධි/පශ්චාත් උපාධි ඩිප්ලෝමා සුදුසුකම් හෝ සම මට්ටමේ වෘත්තීමය සුදුසුකම් සමඟ අදාල විෂය ඉගැන්වීමේ/කර්මාන්තයේ අවම වසර 5ක පලපුරුද්ද | 800/= |
| 04 | අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි/ආචාර්ය උපාධි සුදුසුකම් හෝ වෘත්තීය සුදුසුකම් සමඟ අදාල විෂය ඉගැන්වීමේ/ කර්මාන්තයේ අවම වසර 5ක පලපුරුද්ද | 1000/= |

AR - Pl note

| NVQ 6 මට්ටමේ වැඩසටහන් සඳහා | | |
|---|---|---|
| | බාහිර කථිකාචාර්යවරුන් සතුවිය යුතු සුදුසුකම් හා පලපුරුද්ද | බාහිර කථිකාචාර්යවරුන් සඳහා(පැයකට රු.) |
| 01 | අදාල ක්ෂේත්‍රයේ උපාධි/පශ්චාත් උපාධි/ ඩිප්ලෝමා සුදුසුකම් හෝ අදාල ක්ෂේත්‍රයේ සමාන වෘත්තීමය සුදුසුකම් සමඟ අදාල විෂය ඉගැන්වීමේ /කර්මාන්තයේ අවම වසර 5ක පලපුරුද්ද | 800/= |
| 02 | අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි/ආචාර්ය උපාධි සුදුසුකම් හෝ සමාන වෘත්තීය සුදුසුකම් සමඟ අදාල විෂය ඉගැන්වීමේ/කර්මාන්තයේ අවම වසර 5ක පලපුරුද්ද | 1000/= |

03. තවද, NVQ 5 හෝ NVQ 6 පාඨමාලාවන් සඳහා උපාධි වැඩසටහන් සඳහා ලබා දෙන දීමනාව අදාල කර ගැනීම යෝග්‍ය නොවන බව ද මෙම කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කෙරේ.

අත්සන/- අනුර ජයවික්‍රම
ලේකම්
ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව

පිටපත් : 01. ලේකම්,
විද්‍යා, තාක්ෂණ,පර්යේෂණ ,නිපුණතා සංවර්ධන
හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය
පිළිබඳ අමාත්‍යාංශය

02. උප කුලපති,
වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය

03. අධ්‍යක්ෂ,
රත්මලාන විශ්ව විද්‍යාල විද්‍යායතනය

} කරු. දැ.ගැ.ස